ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය
කොළඹ

# මාධ්‍ය ප්‍රකාශනය

මහජන කටයුතු අංශය
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

## පැසිෆික් ඒන්ජල් 2018 ශ්‍රී ලංකාවේදී ආරම්භ වෙයි

**අගෝස්තු 1, කොළඹදීය** - ඇමරිකා එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව බහුජාතික හවුල්කරුවන් හා එක්ව පැසිෆික් ඒන්ජල් (PACANGEL) 2018 කොටසක් ලෙස අනුරාධපුර සහ ඒ අවට 2018 හි අගෝස්තු මස 06 - 20 මානුෂීය ආධාර වැඩසටහන් පවත්වනු ලැබේ.

පැසිෆික් ඒන්ජල් PACANGEL යනු සාමාන්‍ය සෞඛ්‍යය, දන්ත, දෘෂ්ටි, ළමා රෝග සහ ඉංජිනේරු වැඩසටහන් මෙන්ම විවිධ විෂය ක්ෂේත්‍රයන්හි විශේෂඥතා දැනුම හුවමාරු වන වාර්ෂික ඒකාබද්ධ මානුෂීය ආධාර සහ ආපදා සහන සේවා සපයන වැඩසටහනකි. මෙහිදී 65 කට ආසන්න ඇමරිකා එක්සත් ජනපද යුධ හමුදා සාමාජිකයින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සහ යුධහමුදා බලකායන් සමග පුහුණුව ලබන අතර කොළඹ, අනුරාධපුර සහ වව්නියාව යන ප්‍රදේශවල වෛද්‍ය ආධාර සහ ඉංජිනේරු සහාය සපයනු ඇත.

මෙම කාලය තුළ ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ ඇමරිකා එක්සත් ජනපද යුධහමුදාව එක්ව අදාළ ප්‍රදේශයේ පාසල් අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණයන් සිදුකරනු ඇත. එක්සත් ජනපද සහ ශ්‍රී ලංකාවේ ගුවන් හමුදා සාමාජිකයන් වෛද්‍ය ක්ෂේත්‍රයේ යහභාවිතාවන් බෙදාහදා ගනිමින් දේශීය ජනතාවට වෛද්‍ය සේවාවන් ගණනාවක් සපයනු ඇත. මෙම අවස්ථාවට බංග්ලාදේශ, නේපාල සහ මාලදිවයින යන රටවල සෞඛ්‍ය සේවාවන් සපයන්නනන්ද සහභාගී වේ.

අපට සහයෝගයෙන් කටයුතු කිරීමට ලැබෙන මෙම සෑම අවස්ථාවකින්ම අපගේ හමුදාවන් අතර සහයෝගිතාවය වර්ධනය වන අතර එමගින් දේශීය ජනතාවට ප්‍රතිලාභ හිමිවන බව වැඩබලන ඇමෙරිකානු තානාපති රොබර්ට් හිල්ටන් ප්‍රකාශ කලේය. “පැසිෆික් ඒන්ජල් වැඩසටහන තුළින් ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් අපගේ සහයෝගීතාවය වර්ධනයවීම තුළින් සාමාන්‍ය ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිතයේ සුභදායී වෙනසක් සිදු කරන්නේ කෙසේද යන්න මනාව පැහැදිලි කරනු ලබයි“

එකොළොස්වන අවුරුද්දට පියමනින පැසිෆික් ඒන්ජල් වැඩසටහන PACANGEL මානුෂිය අර්බුදයන් විසඳීමට කලාපයේ සන්නද්ධ හමුදා එකට එක්ව සහයෝගයෙන් කටයුතු කිරීමට සූදානම්ව සිටින බව තහවුරු කරයි. 2007 වර්ෂයේ සිට මෙම මානුෂිය ආධාර වැඩසටහන තුළින් දන්ත, අක්ෂි, ළමා රෝග, ද ඇතුලු විවිධ වෛද්‍ය සේවාවන් සහ භෞතික චිකිත්සාවන් හි සිට සිවිල් ඉංජිනේරු වැඩසටහන් හා

මානුෂීය ආධාර හා ආපදා සහන  සපයමින් සහ අත්දැකීම් හුවමාරු කරගනිමින් පැසිෆික් ඒන්ජල් මානුෂිය ආධාර වැඩසටහන ි දස දහස් ගණනක් වූ මිනිසුන්ගේ ජීවිත වැඩිදියුණු කර ඇත. 2016 වසරේදී පැසිෆික් ඒන්ජල් වැඩසටහන යාපනය අවට ප්‍රදේශයන්හිදී පවත්වනු ලැබිණි.